# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 176/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 30/01/2024<br>පැය 1440 |

# මාධ්‍ය නිවේදනය

## අධිකරණ නියෝග දැනුම් දීම.

අධිකරණ නියෝගය :- මාලිගාකන්ද

2024.01.30 වන අද දින සමගි ජන බලවේගය දේශපාලන පක්ෂය විසින් විරෝධතාවයක් සූදානම් කර ඇති බවට මරදාන පොලිස් ස්ථානාධිපතිවරයාට ලද තොරතුරක් මත ඔහු විසින් මාලිගාකන්ද ගරු මහේස්ත්‍රාත් අධිකරණය මඟින් එය තහනම් කරන ලෙසට ඉල්ලීමක් කර තිබිණි.

ඒ අනුව, ගරු අධිකරණය මඟින් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබර් රහුමාන් මහතා ඇතුළු වගඋත්තරකරුවන් 16 දෙනෙකු ඇතුළු සහභාගී වන සියළු සාමාජිකයින් හා ඔවුන්ගේ අනුගාමිකයින්ට ලිප්ටන් වටරවුම, ඩීන්ස් පාර, ටී.බි.ජායා මාවත, මරදාන හන්දිය ඔස්සේ ඒල්ෆින්ස්ටන් ඉදිරිපිටින් ටෙක්නිකල් හන්දිය, ඔල්කට් මාවත දක්වාද පංචිකාවත්ත වටරවුම, සංඝරාජ මාවත, ටෙක්නිකල් හන්දිය ඔස්සේ ඔල්කට් මාවත ඔස්සේ කොළඹ කොටුව මුදල් අමාත්‍යාංශය දක්වා වූ මෙම අධිකරණ බල සීමාව තුල මාර්ග හා පදික වේදිකා සාමාන්‍ය මහජනතාවට වාහන වලින් හා පා ගමනින් ගමන් කිරීමට නොහැකි වන ලෙස අහුරමින් සිදු කරන විරෝධතා පාගමන් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 106 වගන්තිය යටතේ 2014.01.30 වන දින පැය 1200 සිට 2024.01.31 වන දින පැය 1000 දක්වා තහනම් කරමින් අඥාවක් නිකුත් කර ඇත.

සිය භාෂණයේ නිදහස භාවිතා කිරීම උදෙසා කිසිදු බාධාවක් සිදු නොකරමින් ඔවුන්ගේ මතයන් ප්‍රකාශ කිරීම උදෙසා මෙම අධිකරණ බල ප්‍රදේශයට යත් පී.ඩී.සිරිසේන ක්‍රීඩාංගනය හා හයිඩ් පාර්ක් පිටිය ඔවුන් වෙනුවෙන් වෙන්කොට තැබීමටත් එම පිටි තුළ විරෝධතා දැක්වීමට බාධා සිදු නොවන බවත් නියෝගයෙන් දැනුම් දී ඇත.

අධිකරණ නියෝගය :- කොටුව

2024.01.30 වන අද දින සමගි ජන බලවේගය දේශපාලන පක්ෂය විසින් සංවිධානය කර ඇති විරෝධතාවයක් හේතුවෙන් එය තහනම් කරන ලෙසට ඉල්ලා කොටුව පොලිස් ස්ථානාධිපති විසින් කොටුව ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉල්ලීමක් කර තිබිණි.

ඉදිරිපත් කල කරුණු අනුව අපරාධ නඩු විධාන සංග්‍රහයේ 106 වගන්තිය ප්‍රකාරව කොටුව ගරු මහේස්ත්‍රාත් අධිකරණය මඟින් පහත සඳහන් වග උත්තරකරුවන් වන විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා ඇතුළු 16 දෙනෙකු ඇතුළු සහභාගී වන සියළු සාමාජිකයින් හා ඔවුන්ගේ අනුගාමිකයින්ට 2024.01.30 වන දින පැය 0900 ත් පැය 2000 ත් අතර කාලයේදී කොටුව පොලිස් වසමේ සෙරමික් හන්දියේ සිට එන්.එස්.ඒ.වටරවුම දක්වා මාර්ගය, එන්.එස්.ඒ.වටරවුම සිට ගාලු මුවදොර, ගාලු මුවදොර වටරවුම දක්වාද, ඩී.ආර්.විජේවර්ධන මාවත, කොම්පඤ්ඤ වීදිය පොලිස් වසමේ ධර්මපාල මාවත සිට පිත්තල හන්දිය දක්වාද, බාලදක්ෂ මාවත සිට උත්තරානන්ද මාවත දක්වාද මාර්ගය අවහිර නොකරන ලෙසත් මුදල් අමාත්‍යාංශය, ජනාධිපති ලේකම් කාර්යාලය, මහබැංකුව, ජනාධිපති මන්දිරයට ඇතුළු වීම වලකින ලෙසටත් පොදු හා පුද්ගලික දේපල වලට හානි නොකරන ලෙසටත් ආඥාවක් නිකුත් කර ඇත.

මෙම අඥාව කඩකිරීම ලංකා දණ්ඩනීති සංග්‍රහය යටතේ දඩුවම් ලැබිය හැකි වරදක් බවට ආඥා මඟින් දැනුම් දී ඇත.